# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 19 වැනි කාණ්ඩය | ජනවාරි 2022



- නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කෙරේ.

- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට නව සාමාජික මන්ත්‍රීවරුන් නම් කෙරේ.

- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා (Annual Reports), කාර්ය සාධන වාර්තා (Performance Reports), ප්‍රගති වාර්තා (Progress Reports) හඳුනාගනිමු.

## “රට වෙනුවෙන් නිසි යුතුකම් සහ වගකීම් ඉටු කිරීමට පෙළ ගැසෙමු”

### කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

රට වෙනුවෙන් නිසි යුතුකම් හා වගකීම් ඉටු කිරීමට සියලු දෙනා එක්විය යුතු බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සඳහන් කළේය. පසුගිය දෙවසර තුළ අභියෝග රැසකට රට මුහුණ දුන් බවත්, රටේ පවතින අභියෝග ජයගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට සියලුදෙනා කටයුතු කළ යුතු බවත් හෙතෙම පැවසීය.

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# පාර්ලිමේන්තුව සැකෙවින්...

## ජනවාරි 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**ජනවාරි 03**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලය සහ අනෙකුත් අනුබද්ධිත කාර්ය මණ්ඩල ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් සාමාජික සාමාජිකාවන් ප්‍රතිඥා දීම/ දිවුරුම් දීම සිදුකර නව වසරට රාජකාරි ආරම්භ කිරීම.

**ජනවාරි 04**

පාර්ලිමේන්තු පරිශ්‍රයේ වැඩවසන ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස නව වසරට සෙත්පතා බෝධි පූජා පිංකම පැවැත්වීම.

**ජනවාරි 05**

කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට චීන කථානායකවරයාගෙන් නව වසර සඳහා සුබපැතුම් පිරිනැමීම.

**ජනවාරි 18**

*පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කිරීම*

- පාර්ලිමේන්තුවේ දෙවැනි සභා වාරය ආරම්භ කිරීම සහ පාර්ලිමේන්තුව කැඳවීම.
- අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව අමතමින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම.

**ජනවාරි 19, 20 සහ 21**

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය විවාද කිරීම.

**ජනවාරි 19**

සභාපති නාමාවලිය සඳහා මන්ත්‍රීවරයන් නම් කිරීම

පහත සඳහන් පනත් කෙටුම්පත් පළමුවැනි වර කියවීම:

- පෞද්ගලික දත්ත ආරක්ෂණ
- වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන)
- විශේෂ භාණ්ඩ හා සේවා බදු
- එකතු කළ අගය මත බදු (සංශෝධන)

තේරීම් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීම

**ජනවාරි 20**

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීම.

**ජනවාරි 21**

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත පළමුවැනි වර කියවීම.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, ගෘහ්‍ය කාරක සභාව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව යනාදියට සාමාජික මන්ත්‍රීවරයන් නම් කිරීම.

**ජනවාරි 21**


දකුණු කොරියානු කථානායකවරයා කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවීම සහ එදින පාර්ලිමේන්තු රැස්වීම නැරඹීම.

# අන්තර්ගතය













## පුවත්


- “රට වෙනුවෙන් නිසි යුතුකම් සහ වගකීම් ඉටු කිරීමට පෙළ ගැසෙමු” කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා නව වසරේ රාජකාරි ආරම්භ කරමින් පවසයි.
- නව වසරට සෙත් පතා පාර්ලිමේන්තුවේ වැඩවසන ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස බෝධි පූජා පිංකම.
- නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කෙරේ.
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළ සභාව කල් තැබීමේ විවාදය තෙදිනක් පුරා පාර්ලිමේන්තුවේදී


## කාරක සභා පුවත්


- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට සාමාජික මන්ත්‍රීවරුන් නම් කෙරේ.
- නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කිරීම සඳහා සාමාජික මන්ත්‍රීවරුන් නම් කෙරේ.


## විශේෂාංග


- නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය තුළ ව්‍යවස්ථාදායකයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශයක්...
- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා (Annual Reports), කාර්ය සාධන වාර්තා (Performance Reports), ප්‍රගති වාර්තා (Progress Reports) හඳුනාගනිමු.
- මහජන ඡන්ද බලය හා ශ්‍රී ලංකාව
- ලොවක් වෙනස් කළ WWW.



# “රට වෙනුවෙන් නිසි යුතුකම් සහ වගකීම් ඉටු කිරීමට පෙළ ගැසෙමු” කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා නව වසරේ රාජකාරි ආරම්භ කරමින් පවසයි

**රට වෙනුවෙන් නිසි යුතුකම් හා වගකීම් ඉටු කිරීමට සියලු දෙනා එක්විය යුතු බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සඳහන් කළේය. පසුගිය දෙවසර තුළ අභියෝග රැසකට රට මුහුණ දුන් බවත්, රටේ පවතින අභියෝග ජයගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට සියලු දෙනා කටයුතු කළ යුතු බවත් හෙතෙම පැවසීය.**

2022 වසර සඳහා රාජ්‍ය නිලධාරින් ප්‍රතිඥා / දිවුරුම් දීමේ වැඩසටහනට පාර්ලිමේන්තු සංකීර්ණයේදී පසුගිය (03) දා එක්වෙමින් ගරු කථානායකවරයා මේ බව අවධාරණය කළේය.

කථානායකතුමා විසින් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඉදිරිපස ප්‍රධාන පියගැට පෙළ අසලදී ජාතික කොඩිය එසවීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය නව වසරේ රාජකාරි ඇරඹීමේ උත්සවය ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයෝ එක්ව රාජ්‍ය සේවා ප්‍රතිඥාව / දිවුරුම් දීම සිදු කළහ.

රණවිරුවන් ඇතුළු දේශය වෙනුවෙන් දිවිකැප කළ සියලු දෙනා සැමරීම උදෙසා විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කෙරුණේ ඉන් අනතුරුවයි.

නව වසරේ රාජකාරි ආරම්භ කිරීමේ උත්සවයේදී අදහස් දැක්වූ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසුවේ 2021 වසරේ පැවැති අභියෝග ප්‍රශස්ත ලෙස ජය ගැනීමට පාර්ලිමේන්තුවට හැකි වූ බවයි. එමෙන්ම, කොවිඩ් 19 තත්ත්වය හමුවේ පවතින අභියෝග ජයගැනීමට සියලුදෙනා එක්ව කටයුතු කිරීමේ අවශ්‍යතාව මහ ලේකම්වරයා පෙන්වා දුන්නේය. පසුගිය වසරේ පැවැති අභියෝග ජයගැනීමට හැකි වූයේ කැපවීම සහ වගකීම් සහගතභාවය හේතුවෙන් බවද හෙතෙම පැවසීය. පාර්ලිමේන්තු නිලධාරින් සතු ඉහළ වෘත්තීය නිපුණත්වය

පාර්ලිමේන්තුවේ කටයුතු පහසු කිරීමට හේතුවන බවද මහ ලේකම්වරයා මෙහිදී සඳහන් කළේය.



කොවිඩ් 19 අභියෝගය ජයගැනීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා, ආයතන සහ සමාජය සතු වගකීම පිළිබඳව පාර්ලිමේන්තුවේ වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය නිලධාරී ටී. ආර්. පතිරණ මහතාද මෙහි දී අදහස් පළ කළේය. යහපත් සෞඛ්‍ය පුරුදුවලින් කොවිඩ් 19 අභියෝගය ජයගත හැකි බව පෙන්වා දුන් ඔහු, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම, මුව ආවරණ පැළඳීම සහ නිරන්තරයෙන් සබන් යොදා දෑත් සේදීම ඒ යටතේ ප්‍රමුඛ සාධක වන බවද වෛද්‍යවරයා අවධාරණය කළේය.

මේ අවස්ථාවට නියෝජ්‍ය කථානායක ගරු රංජිත් සියඹලාපිටිය මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා, දෙපාර්තමේන්තු ප්‍රධානීහු සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මෙන්ම අනුබද්ධ කාර්ය මණ්ඩලයද එක්ව සිටියහ.



## පුවත්



# නව වසරට සෙත් පතා පාර්ලිමේන්තුවේ වැඩවසන ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස බෝධි පූජා පිංකම

**2022 නව වසරට ආශිර්වාද පතා පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ වැඩවසන ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියසදී විශේෂ බෝධි පූජා පිංකමක් ජනවාරි 04 දා පෙරවරුවේ පැවැත්විණ.**

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම බෝධි පූජා පිංකම මෙහෙයවනු ලැබුවේ කෝට්ටේ සුනේත්‍රාරාමාධිපති, කොළඹ කළුතර දෙදිසාවේ ප්‍රධාන සංඝනායක, බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ පාලක සභික, අධ්‍යාපන අමාත්‍යාංශයේ බෞද්ධ උපදේශක මණ්ඩලයේ සාමාජික, නාලන්දා විද්‍යාලයේ ධර්මාචාර්ය, පූජ්‍ය ඇලිකේවල සීලානන්ද නායක ස්වාමීන් වහන්සේ විසිනි.

සභානායක අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර, සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක යන මහත්ම මහත්මීහු, දෙපාර්තමේන්තු ප්‍රධානීහු ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මෙන්ම අනුබද්ධ කාර්ය මණ්ඩලයද මේ අවස්ථාවට සහභාගි වූහ.

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය බෞද්ධ සංගමය මෙම ආශිර්වාද බෝධි පූජා පිංකම සංවිධානය කළ අතර, එහි අරමුණ පැහැදිලි කරමින් පිළිගැනීමේ කථාව එම සංගමයේ සභාපති ශාන්ත වීරරත්න මහතා විසින් සිදු කරනු ලැබිණි.







පුවත්

# නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කෙරේ

**නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීම ජනවාරි 18 වන දින සිදු විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් එදින පාර්ලිමේන්තුවේදී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී.**



අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණීමේ උත්සවය ඉතා චාම් ආකාරයෙන් පැවැති අතර එතුමා පිළිගැනීම සඳහා පාර්ලිමේන්තුව ඉදිරිපිටදී පොලිස් සංස්කෘතික කොට්ඨාසයේ දායකත්වයෙන් සංස්කෘතික අංග කිහිපයකින් සමන්විත ආචාර දැක්වීමක් සිදු කෙරුණි.

මෙහිදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාගේ පැමිණීමෙන් පසු, අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පැමිණීම සිදු වූ අතර, ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සම්ප්‍රාප්තිය සිදු වූයේ ඉන් අනතුරුවය.

ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක මහතා විසින් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ප්‍රධාන පියගැට පෙළ අසලදී ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පිළිගැනීමට යෙදිණි. ඉන් පසුව වේත්‍රධාරි, නියෝජ්‍ය වේත්‍රධාරි සහ සහකාර වේත්‍රධාරි පෙරටු කරගත් ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා විසින් අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තු මන්දිරය වෙත කැදවා ගෙන යනු ලැබිණ.






එම අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල දී ශ්‍රී ජයවර්ධනපුර, ජනාධිපති බාලිකා විද්‍යාලයේ සිසුවියන් විසින් ජයමංගල ගාථා ගායනා කර, අතිගරු ජනාධිපතිතුමාට ආශිර්වාද කරන ලදි.

අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව, සභාව කල් තැබීම සිදු කළ අතර ඉන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ ආරාධිත අමුත්තන් වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් ද පැවැත්වුණි.

නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ අවස්ථාවට විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන් ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් සහභාගී වූහ.





පුවත්

# ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළ සභාව කල් තැබීමේ විවාදය තෙදිනක් පුරා පාර්ලිමේන්තුවේදී

ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පසුගිය ජනවාරි 18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ විවාදය ජනවාරි 19, 20 සහ 21 යන තෙදින පුරා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

මේ අනුව ජනවාරි 19 වැනිදා අපරභාග 1.00 සිට අපරභාග 6.00 දක්වා ද ජනවාරි 20 වැනිදා පූ.භා 10.00 සිට අ.භා 6.00 දක්වා ද ජනවාරි 21 දින පූ.භා 10.00 සිට අ.භා 5.30 දක්වා ද ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ විවාදය පැවැත්වීම සිදු විය.

මෙහිදී ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය කල් තැබීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා යෝජනාව ස්ථිර කළේය. මේ අනුව විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පළමු කතාව සිදු කළේය.






# කාරක සභා පුවත්









# පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට සාමාජික මන්ත්‍රීවරුන් නම් කෙරේ.

**පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධාන සහ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව සඳහා පත්කරන ලද සාමාජික මන්ත්‍රීවරුන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් ජනවාරි 20 වැනි දා පාර්ලිමේන්තුවට දැනුම්දෙන ලදි.**

මේ අනුව කථානායකවරයා සභාපතිවරයා ලෙස පත්වන අතර නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා ඇතුළු තවත් සාමාජික මන්ත්‍රීවරුන් 21 දෙනෙකු මෙම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් ලෙස පත් වේ.

මෙහිදී ගරු සාමාජික මන්ත්‍රීවරුන් 20 දෙනෙකු ගරු කථානායකතුමා විසින් නම් කළ අතර ඉදිරියේදී තවත් එක් මන්ත්‍රීවරයෙකු පත් කිරීමට නියමිතව තිබේ. ඒ අනුව, එදින නම්කළ සාමාජික මන්ත්‍රීවරුන් මෙසේය -

1. ගරු චමල් රාජපක්ෂ මහතා
2. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
3. ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
4. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
5. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
6. ගරු විමල් වීරවංශ මහතා
7. ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
8. ගරු මහින්ද අමරවීර මහතා
9. ගරු වාසුදේව නානායක්කාර මහතා
10. ගරු ප්‍රසන්න රණතුංග මහතා
11. ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා
12. ගරු ගයන්ත කරුණාතිලක මහතා
13. ගරු රවුෆ් හකීම් මහතා
14. ගරු අනුර දිසානායක මහතා
15. ගරු ඩිලාන් පෙරේරා මහතා
16. ගරු රිසාඩ් බදියුදීන් මහතා
17. ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
18. ගරු මනෝ ගනේෂන් මහතා
19. ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
20. ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා



# නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කිරීම සඳහා සාමාජික මන්ත්‍රීවරුන් නම් කෙරේ.

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කිරීම සඳහා සාමාජික මන්ත්‍රීවරුන් නම් කිරීම පසුගිය (19) දා සිදු කරන ලදි.

ඒ අනුව, පහත සාමාජික මන්ත්‍රීවරු තේරීම් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරු ලෙස සේවය කරනු ලබති:-

1. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
2. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
3. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
4. ගරු ඩග්ලස් දේවානන්ද මහතා
5. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
6. ගරු විමල් වීරවංශ මහතා
7. ගරු ප්‍රසන්න රණතුංග මහතා
8. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
9. ගරු ගයන්ත කරුණාතිලක මහතා
10. ගරු රවුෆ් හකීම් මහතා
11. ගරු විජිත හේරත් මහතා
12. ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා






# ව්‍යවස්ථාදායකයේ කාර්ය සාධනය

# නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය තුළ ව්‍යවස්ථාදායකයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශයක්...

නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය 2020 අගෝස්තු 20 බ්‍රහස්පතින්දා සිට 2021 දෙසැම්බර් 12 ඉරිදා දක්වා බලාත්මකව තිබූ එම කාලසීමාව තුළ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සිදුවූ ආකාරය සංක්ෂිප්තව පහත සඳහන් ආකාරයට විස්තර කළ හැකි ය:-

- පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 130 ක් පවත්වන ලද අතර ඒ සෑම රැස්වීම් දිනයක් සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර, ලිපි ලේඛනාදිය පිළිගැන්වීමේ ලේඛන, දිනට නියමිත වැඩ පිළිවෙළ, පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්, යනාදී වැඩ කටයුතු භාෂා ත්‍රිත්වයෙන් සූදානම් කිරීම;

- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තු ප්‍රශ්න, විවිධ පනත් යටතේ නියෝග, නියමයන්, රෙගුලාසි, යනාදී අනුනීතිවලට අදාළ යෝජනා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා යනාදිය සඳහා විධිමත් දැනුම්දීම් ලබාදීම පිණිස පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තක 4ක්ද, ඒ හා සම්බන්ධ පරිපූරක 54ක්ද, මුද්‍රණය කර පළ කිරීම;

- පසුපෙළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් බොහෝ දෙනෙකු විසින් වාචික පිළිතුරු අපේක්ෂා කරන පාර්ලිමේන්තු ප්‍රශ්න 3797ක් භාරදෙන ලද බවත්, ඒවායින් 752කට සම්පූර්ණ වශයෙන් පිළිතුරු ලබා දී ඇති බවත්, එවැනි ප්‍රශ්න 65කට පිළිතුරු ලබාදීමට කල් ලබාගෙන තිබීම;

- 2021 අප්‍රේල් 05 දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 50ක්ද, 2021 සැප්තැම්බර් 06 දින 40ක්ද, 2021 නොවැම්බර් 08 දින 50ක්ද, වශයෙන් විශේෂ පාර්ලිමේන්තු රැස්වීම් 03ක් පැවැත්වීම විශේෂත්වයක් වීම;

- පසුපෙළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් බොහෝ දෙනෙකු විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනා 88ක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබීම;

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පනත් කෙටුම්පත් 37ක් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීමෙන් අනතුරුව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් ඒවායේ සහතිකය සටහන් කිරීම:

ඊට අනුකූලව, සම්මත පනත් 2020 වර්ෂයේ 7ක්ද, 2021 වර්ෂයේ 30ක්ද, වශයෙන් වූ අතරම ඒවා අතුරින් මතු සඳහන් ඒවා විශේෂයෙන් සඳහන් කළ හැකි ය:-

• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2020 ඔක්තෝබර් 29 දින,

• කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව 2021 මැයි 27 දින, 2021 අංක 11,

• කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් 19) (තාවකාලික විධිවිධාන) 2021 අගෝස්තු 23, 2021 අංක 17,

• මුදල් 2021 සැප්තැම්බර් 15, 2021 අංක 18,

• ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා 2021 සැප්තැම්බර් 21, 2021 අංක 19,

• ඛනිජ තෙල් සම්පත් 2021 ඔක්තෝබර් 08, 2021 අංක 21, වශයෙන්ද සහතිකය සටහන් කිරීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු බව සනාථ කරමින් ඒ පශ්චාත් කාර්යභාරය වෙනුවෙන් සෘජුව සහාය ලබාදෙන අධීක්ෂණ කාරක සභා වශයෙන් ව්‍යවස්ථාදායකය තුළ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පළමුවැනි

සභාවාරයේදී ක්‍රියාත්මක වූ ආකාරය පහත ආකාරයට සඳහන් කළ හැකි ය:“

■ **රජයේ ගිණුම් කාරක සභාව**
**රාජ්‍ය ආයතන පරීක්ෂාවට ලක් කිරීම පිණිස ක්‍රමවේද දෙකක් අනුගමනය කිරීම---**

(අ) පරිගණක මාර්ගගත ක්‍රම වේදයක් ඔස්සේ වාර්ෂිකව එම රාජ්‍ය ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීම; සහ

(ආ) කාරක සභාව ඉදිරියට කැඳවීම්

අභිප්‍රාය

ස්වකීය මූල්‍ය විනය, කාර්ය සාධන මට්ටම, මහ ජනතාවට සේවා සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා නිසි විධික්‍රම අනුගමනය කිරීමට රජයේ ආයතනවලට මඟ පෙන්වීම.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධාන ඉපයීමේ ආයතන ත්‍රිත්වයයි. රජයේ ආදායමෙන් 90% ක් පමණ ලබාදෙන නිසා ජාතික ආර්ථිකයට ඒවා මඟින් ලබාදෙන දායකත්වය ඉහළ නැංවීම.

**පළමුවැනි වාර්තාව**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 230 වශයෙන් පිටු 119 කින් සමන්විත වාර්තාව
2021 ජූලි 20 වැනි දින;
(https://www.parliament.lk/uploads/comreports/1628054963082538.pdf#page=1)

**දෙවැනි වාර්තාව**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 239 වශයෙන් පිටු 132 කින් සමන්විත වාර්තාව
2021 ඔක්තෝබර් 06 වැනි දින;
(https://www.parliament.lk/uploads/comreports/1633509098061240.pdf#page=1)

**තෙවැනි වාර්තාව**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 242 වශයෙන් පිටු 761 කින් සමන්විත වාර්තාව
2021 ඔක්තෝබර් 07 වැනි දින;
(https://www.parliament.lk/uploads/comreports/1633584378045354.pdf#page=1)
කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

■ **පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**

අභිප්‍රාය
මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය හා එම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනය සම්පාදනය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම.

නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ පාරිසරික බලපෑම පිළිබඳව සිදු කරන ලද විවරණයේදී මතු වූ වැදගත් කාරණයක් වූයේ පරිසර විෂය අයත් විය යුත්තේ සමගාමී ලැයිස්තුවටද, එසේ නැතහොත් මධ්‍යම රජය යටතටද, යන්නයි. මේ සම්බන්ධයෙන් සමාජයේ සහ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කිරීම.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය විසින් ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳව සිදු කරන ලද විමර්ශනය සොයා බැලීම.

**පළමුවැනි වාර්තාව**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 184 වශයෙන් පිටු 102 කින් සමන්විත වාර්තාව
2021 මාර්තු 10 වැනි දින;
(https://www.parliament.lk/uploads/comreports/1617691729015501.pdf#page=1)

අභිප්‍රාය
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මඟින් ආයෝජනය කර පිහිටුවන ලද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) පිළිබඳ විශේෂ විමර්ශනය.

**දෙවැනි වාර්තාව**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 185 වශයෙන් පිටු 467 කින් සමන්විත වාර්තාව
2021 අප්‍රේල් 06 වැනි දින;
(https://www.parliament.lk/uploads/comreports/1617702449078173.pdf#page=1)
කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා විසින් ඉහත වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**එච්. ඊ. ජනකාන්ත සිල්වා**
**අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව/ සන්නිවේදන දෙපාර්තමේන්තුව)**



විශේෂාංග

# පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා (Annual Reports), කාර්ය සාධන වාර්තා (Performance Reports), ප්‍රගති වාර්තා (Progress Reports) හඳුනාගනිමු.

**සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ කටයුතුවලදී විවිධ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, පිළිගැන්වීම එසේ නැතහොත් සභාගත කිරීම සිදුවන බව අපි අසා ඇත්තෙමු; දැක ඇත්තෙමු. ඒ අතුරින් වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා හා ප්‍රගති වාර්තා පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් වේ, මෙකී වාර්තා කෙටියෙන් හඳුන්වාදීමට හා ඒ එක් එක් වාර්තාවල පවත්නා වෙනස්කම් සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ ඒවා සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙත පිළිබඳ නිරවුල් හා පැහැදිලි අවබෝධයක් ලබා දීමට මෙම කෙටි සටහනෙන් අපේක්ෂා කෙරේ.**

## 01. වාර්ෂික වාර්තා (Annual Reports)




රජයට අයත් සංස්ථා, මණ්ඩල, බැංකු, රාජ්‍ය සමාගම්, විශ්වවිද්‍යාල, නැතහොත් විශේෂ පාර්ලිමේන්තු පනතකින් හෝ සමාගම් පනත යටතේ හෝ ස්ථාපිත ආයතන විසින් යම් නිශ්චිත වර්ෂයක් තුළ තම ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර, විශේෂයෙන් වාර්ෂික ගිණුම් ද එම ගිණුම් විගණනය කිරීමට අදාළ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද ඇතුළත් කර වාර්ෂිකව පිළියෙල කරනු ලබන වාර්තාව, වාර්ෂික වාර්තාව යන්නෙන් සරලව අදහස් කෙරේ.

මෙම වාර්තාව පොදුවේ, වාර්ෂික වාර්තාව, ලෙස නම් කළ ද, ඇතැම් ආයතන විසින් " වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් ප්‍රකාශය" ලෙස ද, "විගණනය කරන ලද ගිණුම් හා විගණකයන්ගේ වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව" ලෙස ද, ඒ හා සමාන වෙනත් නම්වලින් ද හඳුන්වනු ලබයි.

යථෝක්ත ආයතන විසින් භාෂාත්‍රයෙන් පිළියෙල කරනු ලබන වාර්ෂික වාර්තා අදාළ වර්ෂය අවසන් වී දින 180ක් ගත වන්නට ප්‍රථම, නැතහොත් මාස 06කට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ද ලබා ගැනීම සිදු කරනු ලැබේ. මෙම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හා ඒවා පිළිබඳ කටයුතු කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මඟින් පැහැදිලි උපදෙස් ලබා දී ඇත.

ඉහත විස්තර කර ඇති පරිදි අදාළ ව්‍යවස්ථාපිත ආයතනය අයත් අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යවරයා

විසින් අමාත්‍ය මණ්ඩල අනුමතියේ පිටපතක් ද සහිතව, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්වරයා හරහා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලබයි. එම ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්වරයා දැනුම් දෙනු ලබන නියමිත දිනයේදී අදාළ වාර්ෂික වාර්තාව අදාළ කැබිනට් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.

වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන අවස්ථාවේදී ඒ සම්බන්ධව වැඩිදුර සලකා බැලීම සඳහා කාරක සභාවකට යොමු කිරීම සාමාන්‍යයෙන් සිදු වන්නකි. ඒ අනුව අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වෙත වාර්ෂික වාර්තා යොමු කරනු ලබන අතර කිසිදු අමාත්‍යාංශයක විෂය පථයකට නොගැනෙන ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික වාර්තා සලකා බැලීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් ස්ථාපිත විශේෂ කාරක සභාවකට යොමු කරනු ලැබේ.

වාර්ෂික වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව, ඊට අදාළ, කාරක සභාවේ වාර්තාව කාරක සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් සභික මන්ත්‍රීවරයෙකු විසින් හෝ පාර්ලිමේන්තුවට පිළිගැන්වීම සිදු කරනු ලබයි.

කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්වීමෙන් අනතුරුව අදාළ අමාත්‍යාංශය විසින් එකී වාර්ෂික වාර්තාව සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය අපේක්ෂාවෙන් පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්වරයා මඟින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධාන ප්‍රකාර විධිමත් දැනුම් දීම සඳහා න්‍යාය පුස්තකයෙහි හෝ ඒ හා සම්බන්ධ පරිපූරකයෙහි පළ කිරීම සිදු වේ. ඉන් අනතුරුව එය න්‍යාය පත්‍රයට ඇතුළත් කොට පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබයි.

න්‍යාය පත්‍රයේ පළ වී ඇති වාර්ෂික වාර්තාවලට අදාළ යෝජනා වාර්ෂිකව ඉදිරිපත් කරන විසර්ජන පනත් කෙටුම්පතට අදාළව ඒ ඒ අමාත්‍යාංශයීය වැය ශීර්ෂ සාකච්ඡාවට භාජන කෙරෙන අවස්ථාවන්හිදී අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සාමාන්‍යයෙන් සිදු කරනු ලැබේ.

වාර්ෂික වාර්තාව සම්බන්ධ එකී යෝජනාව සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ලැබීමත් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා සම්බන්ධ පාර්ලිමේන්තු ක්‍රියාදාමය අවසන් වෙයි.

## 02. කාර්ය සාධන වාර්තා (Performance Reports)

**කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශ, යම් කොමිෂන් සභා, රජයේ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ද ඇතුළුව ඒ ඒ ආයතනය විසින් අදාළ වර්ෂය තුළ තම ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මූල්‍ය ප්‍රකාශන ඊට අදාළ විගණන වාර්තා ද ඇතුළත් කරමින් පිළියෙල කරනු ලබන වාර්තාව 'කාර්ය සාධන වාර්තාව' ලෙස හඳුන්වනු ලබයි.**




අප ඉහතින් විස්තර කරන ලද වාර්ෂික වාර්තා මෙන් මෙකී කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීම සාමාන්‍යයෙන් සිදු නොවේ. කෙසේ වුවද, අංක 02/2020 හා 2020. 08. 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රයෙන් මුද්‍රණය කර, මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වන්නට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු ය.

මෙම කාර්ය සාධන වාර්තා ද, අදාළ ආයතනය අයත් අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්වරයා හරහා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත සභානායක ලේකම්වරයා දැනුම් දෙන නිශ්චිත දිනයේදී එකී කැබිනට් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්වීම සිදු කරනු ලබයි.

වාර්ෂික වාර්තා මෙන් කාර්ය සාධන වාර්තා සලකා බැලීම සඳහා කාරක සභාවකට යොමු කිරීම සිදු නොවන බවත්, යෝජනාවක් මඟින් පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගැනීමක් ද සිදු නොවන බවත් මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ඒ අනුව, මෙකී කාර්ය සාධන වාර්තා සම්බන්ධ පාර්ලිමේන්තු ක්‍රියාදාමය එකී වාර්තා පිළිගැන්වීම හෙවත් සභාගත කිරීමත් සමඟ අවසන් වේ.

## 03. ප්‍රගති වාර්තා (Progress Reports)

**වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන විසර්ජන පනත් කෙටුම්පතට අදාළව ඒ ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට බඳුන් වන අයවැය කාරක සභා අවස්ථා විවාදයට සම්බන්ධ වන මන්ත්‍රීවරුන් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා එක් එක් අමාත්‍යාංශ හා ඒවා යටතට ගැනෙන ආයතනවල මෑත කාලීන ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර ඇතුළත් කොට පිළියෙල කරනු ලබන වාර්තාව 'ප්‍රගති වාර්තාව' යන්නෙන් අදහස් වේ.**




ප්‍රගති වාර්තාව, යට කී අනෙකුත් වාර්තා මෙන් නොව වර්ෂයේ එක් නිශ්චිත කාල වකවානුවකදී පමණක්, එනම් වාර්ෂිකව පැවැත්වෙන අයවැය කාරක සභා අවස්ථාවේදී පමණක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත ඉදිරිපත් කරනු ලබන්නකි. තව ද මෙය, අමාත්‍යාංශවලට සහ ඊට අයත් ඒ ඒ ආයතනවල මෑත කාලීන ක්‍රියාකාරිත්වය පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් දැනුම්වත් කිරීමේ සහ අදාළ වැය ශීර්ෂ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමේදී පාදක කර ගත හැකි. එකී ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු ලබා දීමේ අරමුණින් පිළියෙල කරනු ලබන වාර්තාවකි.

තවද ප්‍රගති වාර්තාව වාර්ෂික වාර්තාව සහ කාර්ය සාධන වාර්තාව මෙන් අදාළ අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්වීමක් සිදු නොකරන බවත් එය මන්ත්‍රීවරයන් අතර බෙදා හැරීමක් පමණක් සිදුවන බවත් මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

ඉහත සඳහන් වාර්තා ත්‍රිත්වයම භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් පවතින බව ද මෙහිලා පොදුවේ සඳහන් කළ යුතුය.

**එම්. ජයලත් පෙරේරා**
**සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)**
**සභාලේඛන කාර්යාංශය**

## කවරයේ කතාව

මේ නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කළ අභිමානවත් දිනයේ කැමරා ඇසට හසුවූ තවත් එක් සුවිශේෂී අවස්ථාවකි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රධාන ද්වාරයෙන් පාර්ලිමේන්තුවට පිවිසි පසු සම්ප්‍රදායානුකූලව, කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා, පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා, සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා සමඟ ගෞරව සම්ප්‍රයුක්තව පෙරහැරින් සභාගර්භය වෙත කැඳවාගෙන යනුයේ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා විසිනි.



විශේෂාංග

# මහජන ඡන්ද බලය හා ශ්‍රී ලංකාව

**මැතිවරණයක දී ඡන්දය භාවිත කිරීම ඉංග්‍රීසි භාෂාවෙන් "Suffrage (සෆ්රිජ්)" යැයි පැවසේ. එයට, විධායකය හෝ ව්‍යවස්ථාදායකය වෙනුවෙන් ජනතාව නියෝජනය කිරීම සඳහා නියෝජිතයින් තෝරා පත් කර ගැනීමට මෙන් ම ජනතාවගේ අනුමතය ලබා ගැනීමට යොමු කරන ලද නීති කෙටුම්පත් උදෙසා (ජනමත විචාරණය) ඡන්දය භාවිත කිරීම ද ඇතුළත් වෙයි. ඡන්දය භාවිත කරන ජනතාව ඡන්දදායක පිරිස (Electorate) ලෙස හඳුන්වනු ලබයි. එකී අර්ථයට අමතරව මැතිවරණ කොට්ඨාසයක සිටින ඡන්දය දීමට නීත්‍යනුකූල අයිතිය ඇති සමස්ත ජනයා යන තේරුම ද ඇතුළත් ය.**

මානව ඉතිහාසය පිරික්සා බලන විට පෙනී යන කාරණයක් වනුයේ ඡන්දය භාවිත කිරීම බොහෝ අවස්ථාවන් හි දී වරප්‍රසාද ලත්, එසේත් නොමැති නම් තෝරාගත් කණ්ඩායමකට හෝ පුද්ගලයින්ට පමණක් සීමා වී තිබී ඇති බවයි.

පුරාණ ග්‍රීසිය හා රෝමය තුළ සිදු වුණු ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භයේ සිටම ඉතා ප්‍රාථමික තත්ත්වයේ ඡන්දය භාවිත කිරීමක් සිදු වී තිබේ. මධ්‍යතන යුගය වන විට නාගරික ජනතාවට හා විශාල නගරවල ජීවත් වුණු නිදහස් ජනතාවට සිය නගරාධිපති තෝරා පත් කර ගැනීමේ හැකියාව හිමි වී තිබුණ ද දේපළ හිමිකාරිත්වය මත පදනම් වූ දැඩි නීති මඟින් ඡන්දය භාවිත කිරීමේ සුදුසුකම සීමා වී තිබුණි. පුනරුද සමයේ දී රදළයින් විසින් පාලනය සිදු කළ අතර සෙසු ජනතාවට ඡන්දය භාවිත කිරීමට කිසිදු හැකියාවක් නොවී ය.

යුරෝපය තුළ ඡන්දය භාවිත කිරීම පුළුල් ලෙස පැතිර යාම ආරම්භ වනුයේ වෙළඳාම හා කර්මාන්ත ක්ෂේත්‍රයන්ගේ නැඟීමත්, ඒ හේතුවෙන් ව්‍යාපාරික පන්තියේ නැඟී සිටීමත් නිසා ය. 1832 දක්වාම බ්‍රිතාන්‍යයේ පවා සීමිත පිරිසකට පමණක් ඡන්ද අයිතිය හිමි වී තිබුණි. බ්‍රිතාන්‍යයේ සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම එරට ආරම්භ වූයේ 1928 දී ය.



දේශපාලන ක්‍රමයක් තුළ පුරවැසියන් නිශ්චිත නීතිවලට හා රෙගුලාසිවලට යටත්ව ඡන්දය ප්‍රකාශ කරන ආකාරය මැතිවරණ ක්‍රමය (Electoral System) ලෙස හඳුන්වයි. ඇතැම් විට එය සරල බහුතර ඡන්ද ක්‍රමය ද, සමානුපාතික ක්‍රමය හෝ කේවල ඡන්ද ක්‍රමය ද විය හැකි ය.

සරල බහුතර ඡන්ද ක්‍රමය යටතේ මැතිවරණ කොට්ඨාසයක් ලෙස සලකනුයේ මන්ත්‍රීවරයකු පත් කර ගැනීම සඳහා නිර්ණය කරන ලද නිශ්චිත භූමි ප්‍රදේශයකි. ලැයිස්තු ක්‍රමය යටතේ නම් මේ




තත්ත්වය තරමක් සංකීර්ණ වේ. එහි දී මැතිවරණ දිස්ත්‍රික්කයක් සැලකිල්ලට ලක් කරන අතර ඒ දිස්ත්‍රික්කය සඳහා මන්ත්‍රීවරුන් ගණනාවක් පත් කිරීමේ හැකියාව ඇත.

අනෙකුත් පැවති බ්‍රිතාන්‍ය යටත්විජිත, මෙන් ලංකාවටද 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සර්වජන ඡන්ද අයිතිය සහ 1947 දී පූර්ණ මහ මැතිවරණයක් සහිතව ශ්‍රී ලංකාවට පාර්ලිමේන්තු ආණ්ඩුවේ වෙස්ට්මිනිස්ටර් ආකෘතියක් උරුම විය. මෙරට 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ හා 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වූයේ සරල බහුතර නියෝජන ක්‍රමයයි. වරින් වර සීමා නිර්ණය කොමිෂන් සභා මඟින් ආසන බෙදා වෙන් කිරීමේ රටාවේ යම් යම් වෙනස්කම් ඇති කළ ද සරල බහුතර නියෝජන රටාවේ මූලික වෙනසක් එම ව්‍යවස්ථා තුළ දී සිදු නොවී ය. 1978 දී ශ්‍රී ලංකා රජය පාර්ලිමේන්තු ක්‍රමයේ සිට ප්‍රංශ විලාසිතාවේ විධායක ජනාධිපති ධුරයක් බවට පත් කිරීමට තීරණය කරන ලද අතර අවශ්‍ය පුළුල් පරාසයක ව්‍යවස්ථාමය වෙනස්කම් සලකා බලමින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරන ලදි. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දෙනු ලබන්නේ සමානුපාතික නියෝජන ක්‍රමයේ ලැයිස්තු ක්‍රමයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පෙන්වා දෙන පරිදි එක් පරිපාලන දිස්ත්‍රික්කයක් එක් මැතිවරණ කොට්ඨාසයක් ලෙස හඳුන්වන ලදි.

සමානුපාතික ලැයිස්තු ක්‍රමය යටතේ 1988 දක්වා ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 196 දෙනකුගෙන් 160 දෙනකු ද 1988 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කරනු ලැබූ 15 වන සංශෝධනය මඟින් නියෝජන ක්‍රමයේ හා පාර්ලිමේන්තු සංයුතියේ වෙනසක් සිදු කිරීමෙන් පසුව මන්ත්‍රීවරුන් 225 දෙනකුගෙන් 196 දෙනකු ජනතා ඡන්දයෙන් තෝරා පත්කර ගෙන ඇති අතර මන්ත්‍රීවරුන් 29 දෙනෙකු ජාතික ලැයිස්තුවෙන් තෝරා ගැනුණි.

1988 දී සිදු වූ නියෝජන ක්‍රමයේ වෙනස නම් මනාප ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක වීම ආරම්භ වීමයි. ඒ අනුව එක් ඡන්දදායකයකුට තමන් කැමති පක්ෂයකට ඡන්දය ප්‍රකාශ කර, එම පක්ෂයේ තමන් කැමැති අපේක්ෂකයින් තිදෙනකුගේ අංක මත කතිර සලකුණු කිරීමෙන් මනාප ප්‍රකාශ කිරීමට හැකි විය. මහජනතාව නියෝජනය කරමින් ව්‍යවස්ථාදායකයට ජාතික මට්ටමෙන් ලැයිස්තුවක් මඟින් නියෝජිතයින් පත් කිරීම 1988 දී ආරම්භ වීම ද ලංකා නියෝජන ඉතිහාසයේ වැදගත් සිදුවීමකි. විශේෂයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මන්ත්‍රීවරුන් 29 දෙනෙකු ජාතික ලැයිස්තුවෙන් තෝරාගැනීම වැදගත් තත්ත්වයකි.

කෙසේ වුව ද, සමස්තය සලකා බැලීමේදී පෙනී යන්නේ නියෝජිතයින් තෝරා පත් කර ගැනීමේ දී මහජනතාව විශද කරනු ලබන බුද්ධිමත්භාවය, ජනතාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය හෝ ජනයාගේ තාර්කිකභාවය මත නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යහපත් හෝ අයහපත් විය හැකි බවයි.

**රංජනා රණසිංහ**
**පාර්ලිමේන්තු නිලධාරි**
**පනත් කෙටුම්පත් කාර්යාංශය**






**මීට වසර තිස් තුනකට පෙර, එනම් 1989 මාර්තු මස, *European Particle Physics Laboratory (CERN)* ආයතනයේ සේවය කළ බ්‍රිතාන්‍ය ජාතික මෘදුකාංග ඉංජිනේරුවරයෙක් වූ ටිම් බර්නර්ස්-ලී විසින් 'තොරතුරු කළමනාකරණය' මත පදනම්ව ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවලියක් වර්ල්ඩ් වයිඩ් වෙබ් (WWW) හෙවත් විශ්ව ව්‍යාප්ත වියමන (වෙබ්) වශයෙන් ලොවට හඳුන්වාදීමේ සංකල්පීය පදනම විය. සිය ප්‍රථම මිලියන 50ක් වූ ග්‍රාහක ප්‍රජාව වෙත සමීප වීමට ගුවන් විදුලි මාධ්‍ය වසර 38ක්ද, ටෙලිවිෂන් මාධ්‍ය වසර 15ක්ද ගත කළද, වේගවත්ම සන්නිවේදන මාධ්‍යයක් ලෙස වර්ල්ඩ් වයිඩ් වෙබ් (WWW) ඒ සඳහා ගත කළේ අවුරුදු හතරක් වැනි කෙටි කාලයක් වීම විශේෂත්වයකි.**

1991 වන විට, CERN ආයතනයට පරිබාහිර වූ පුද්ගලයන්ටද මෙම නව වෙබ් ප්‍රජාව සමඟ එක් වන්නට අවකාශය හිමි විය. 1993 අප්‍රේල් මාසය වන විට CERN ආයතනය විසින් වර්ල්ඩ් වයිඩ් වෙබ් (WWW) හෙවත් විශ්ව ව්‍යාප්ත වියමන තාක්ෂණය ඕනෑම කෙනෙකුට ලබා ගත හැකි බව නිවේදනය කරන ලදි.

වර්තමානය වන විට ටිම් බර්නර්ස්-ලී මහතාගේ විශ්ව ව්‍යාප්ත වියමන තාක්ෂණය ලොව වෙනස් කිරීමට, නව එළැඹුම්, නව ප්‍රවණතා ඇති කිරීමට පමණක් නොව අපගේ එදිනෙදා ජීවිතයේ කොටසක් බවට ද පත්ව ඇත. අධ්‍යාපන, මූල්‍ය, සෞඛ්‍යමය අංශ ඇතුළු සමස්ත දෛනික ජීවන රටාව කෙරෙහි මෙන්ම අපගේ රැකියාව, දේශපාලන ව්‍යුහය, අන්තර්ජාතික සබඳතා කෙරෙහිද ඒ තුළ ඇති බලපෑම අතිමහත්ය.

මෙහිදී නිරාකරණය කළ යුතු කරුණක් ඇත. එනම්, බොහෝ පිරිස් 'වෙබ්' සහ 'අන්තර්ජාලය' යන වචන භාවිත කරන්නේ එකම අදහසකින් යුතුව වුවද, 'වෙබ්' සහ 'අන්තර්ජාලය' යන්න එකිනෙකට වියුක්ත වුවකි.

සරලව විශ්ව ව්‍යාප්ත වියමන (වෙබ්) යනු පරිගණකය, ජංගම දුරකථනය හෝ යම් උපාංගයක් භාවිත කරන විට විවෘත කරනු ලබන පිටු (pages) වන අතර අන්තර්ජාලය යනු පරිගණක ජාලයක් ඔස්සේ වෙබ් පිටු සම්බන්ධීකරණය වන පද්ධතියකි. විද්‍යුත් තැපැල් (email), විවිධ ගොනු (files) හුවමාරු වන්නේද මෙකී අන්තර්ජාලය ඔස්සේය.

විශ්ව ව්‍යාප්ත වියමන නිරන්තරයෙන්ම වෙනස් වන සුලුය. ඒ තුළ පවත්නා අවස්ථාවන් අසීමාන්තිකය. එවන් වපසරියක් තුළ ඉදිරි දශක තුළ විශ්ව ව්‍යාප්ත වියමන කෙබඳු ලෙස නව්‍යකරණයන්ට බඳුන් වේද යන්න සැබවින්ම කුතුහලය දනවන්නකි.

ටිම් බර්නර්ස්-ලී මහතා සිය නිර්මාණය ජන ගත කළ පසු නිබඳව එහි අභිවෘද්ධිය උදෙසා කටයුතු කළේය. විශ්ව ව්‍යාප්ත වියමන විවෘත සබඳතා ගොඩනගන, සැමට අයිතිවාසිකම් කිව හැකි, සන්නිවේදනය කළ හැකි, විවිධ වූ නව්‍යකරණයන්ට මං සලසන, ලොවක් යා කරන්නට සමත් වූවක් බවට පත් කිරීම ඔහුගේ දැක්ම විය. නමුත් ඔහුගේ මෙම නිර්මාණය තියුණු පිහි තලයක් වැනිය. අවැසි නම් ඉන් පලතුරු කැපීමටත් එසේ නොමැති නම් යමෙකුගේ ගෙල සිඳීම සඳහාත් භාවිත කළ හැක්කකි. පටු අරමුණු වෙනුවෙන් විශ්ව ව්‍යාප්ත වියමන එහි පරිණාමය තුළ භාවිත වේද නැතහොත් එහි නිර්මාතෘවරයාගේ දැක්ම අනුව එය කෙදිනක හෝ සමස්ත ලොවක යහපත සනිටුහන් කරන්නක් වේද යන්න කිව හැක්කේ කාලයට පමණකි.

**මාධවී රංගේබණ්ඩාර**
**මාධ්‍ය නිලධාරී**
**සන්නිවේදන දෙපාර්තමේන්තුව**


පාර්ලිමේන්තු

ඡායා ගැලරිය

ජනවාරි 21

# දකුණු කොරියානු කථානායකවරයා පාර්ලිමේන්තුවට සපැමිණෙයි...










# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I 19 වැනි කාණ්ඩය I ජනවාරි 2021

ISSN 2806 – 5425



සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka